

1981 වර්ෂයේ කැළණි සරසවියේ උපාධි ප්‍රදානෝත්සවයේදී

## වල්පොල රාහුල හිමියන්

කළ කථාව

# දේශප්‍රේමය - තක්කඩියෙකුගේ අවසාන රැකවරණය

දේශප්‍රේමයේ ජාතිප්‍රේමයේ ආගමේ හා මතවාදයන්ගේ පෙනෙන්නට තිබෙන යහපත් දේ මොනවාදඉ ඒවා ප්‍රශ්න කිරීමකට භාජනය වනු ඇත්තේ කවදාද? අපගේ ජීවිත රැඳී පවත්නා සදාකාලික සත්‍යයන් ඒවා බව පෙනේග එසේ වුවද වරදවා තේරුම් ගත් විට වාර්ගික අරගල ආගමික ගැටුම් ප්‍රාදේශීය හා ජාතිවාදී සටන් හා ජාත්‍යන්තර යුද්ධ ඇති කරන ප්‍රධාන මූලයන් බවට ඒවා පත්වේ.

ඔබ හොඳින් නැවත සිතා බැලුවහොත් පුද්ගලයෙකු ලෝකයේ එක් තැනක හෝ වෙනත් තැනක උත්පත්තිය ලැබිය යුතු බව ඔබට පෙනෙනු ඇත. මිනිසෙකු හෝ ගැහැනියක එසේ ඉපදුණු විට ඒ සමග ඔවුන්ට කිසියම් රටක් ජාතියක් ආගමක් දේශපාලන දර්ශනයක් හෝ මතවාදයක් භාෂාවක් සමාජ කණ්ඩායමක් හෝ කුලයක් උරුම වේ. අනෙක් ඒවාට වඩා ඒවා හොඳ නිසා ඔවුන් ඒවා තෝරා ගත්තා නොවේ. ඒ සියල්ල අහම්බෙන් ලැබෙන දේය.

එසේ වුවදල පුද්ගලයෙකු සිය ආත්මය පිළිබඳ හැඟීම සිය ආත්මාර්ථකාමී මමත්වය * හේතුකොට ගෙන හුදු අහම්බයක් නිසා තමාට උරුම වූ මේවා පිළිබඳව ඇලෙන අතර ඒවා තමාට ඉතාම සුදුසු යයි හැඟුන නිසා තෝරාගත් බවක් අන්‍යන්ට පෙන්වන්නට කටයුතු කරයි. ඔහු ඒවා සමග වෙන් කළ නොහැකි ලෙස සම්බන්ධ වන අතර ඒවා තුළ සිය සතුට විමුක්තිය හා සරණ සොයයි. ඒවා ඉවත් කළ විට කිසිම වටිනාකමක් නැති හිස් බවක්ල අසරණ බවක්ල ඔහුට දැනේ. ඒ නිසාම ආරක්ෂා වනු පිණිස ආවරණය වනු පිණිස වෙනකක් තබා තමා වැදගත් බව හඟවනු පිණිසල ඒවා උත්කෘෂ්ඨත්වයට නංවන්නට ඉහලට ඔසවා තබන්නට වන්දනා මාන කිරීමට ඔහු උනන්දු වෙයි.

කිසියම් කෙනෙකු සභාවක නැගිට මා ශ්‍රේෂ්ඨ යයි විශිෂ්ඨ යයි උතුම් යයි කියමින් තමන් වර්ණනා කෙරෙයි නම් ඒ පුද්ගලයා නිරනුමානයෙන්ම සභාවේ සාධාරණ උපහාසයට ලක්වනු ඇත. එහෙත් ඔහු තමාගේ ජාතිය වර්ගය හෝ ආගම උසස් යයි - එයද තමන් උත්කෘෂ්ඨත්වයට පත් කර ගැනීමේ අනියම් මගකි - කියා සිටින්නේ නම් ජාතිප්‍රේමියෙකු ලෙස හෝ දේශප්‍රේමියෙකු ලෙස හෝ වෙනත් පූජනීය කෙනෙකු ලෙස එම සභාවේ සිටින සිය ජාතියට ආගමට හෝ වර්ගයට අයත් ජනතාව ගෙන් බුහුමන් ලබනවා ඇත. මෙවැනි දේශකයින්ගේ පටු බව හා ලඝු බව දේශප්‍රේමයේ හෝ ජාතිප්‍රේමයේ සළු පිළියෙන් කදිමට වසා ගත හැකිය.

18 වැනි සියවසට අයිති ශ්‍රේෂ්ඨ ඉංග්‍රීසි ලේඛකයෙකු වූ ආචාර්ය ජොන්සන් ට එවැනි පුද්ගලයින් වහ කදුරු මෙන් තිත්ත විය. ඔහු නිතර මේ කුහක භාවය මනසින් ඉවත් කර ගැනීමේ අවශ්‍යතතාව ගැන කථා කළේය. වරෙක බොස්වේල් ඇමතූ ඔහු ඔබේ මනස කුහක බවින් මුදා ගන්නැයි කීවේය. ඔහුගේ සමකාලීනකයෙකු වූ ජෝන් විල්ක්ස් කාන්තාවන් ට ගර්හා කරන ලියවිල්ලක් ලිවීම ගැන සිරගෙට නියම විය. ඉතාම උද්යෝගයෙන් ජාතික හා දේශප්‍රේමී හැඟීම් අවුලවමින් පස් වතාවක් ඡන්දය දිනා ගත් නමුත් සිපිරිගෙට නියම වීම නිසා ඔහුට පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට බැරි වූ විට ආචාර්ය ජොන්සන් කියා සිටියේ දේශප්‍රේමය තක්කඩියෙකුගේ අවසාන රැකවරණය බවයි.

ජොන්සන්ගේ කාලයේ සිටම එන දේශපාලනඥයින් සම්බන්ධයෙන් මෙය සත්‍ය වේග කිසිවෙකු තක්කඩියෙකු වේ නම් ඔහුගේ මුල්ම යොමුව වන්නේ තම ක්‍රියාවන් සාධාරණීකරණය කරනු සඳහා ජාතිප්‍රේමයේ සහය පැතීමය.

ශ්‍රී ලංකාවේ නීති ශිෂ්‍යයන් විසින් තවමත් මහත් උනන්දුවෙන් හදාරනු ලබන රෝමානු නීතියේ මෙවැනි කියමනක් වෙයි.

"සිය දේශය වෙනුවෙන් මිය යාම ප්‍රසන්න හා වැදගත් දෙයකි" රට වෙනුවෙන් ජීවත් වීම ඒ වෙනුවෙන් මිය යාමට වඩා වැදගත් බව පෙන්වන්නටග සාධක කොතෙකුත් තිබියදීත් මෙවැනි ආකර්ෂණීය හා උද්වේගජනක සටන් පාඨ මිනිසුන් අරගලයට යුද්ධයට මෙහෙයවා ඇත.

කිසියම් පුද්ගලයෙකු තම රට ජාතිය හෝ ආගම නොසළකා අමතක කොට ජීවත්විය යුතු යයි කිසිවෙකු යෝජනා නොකරනු ඇත. දේශප්‍රේමය ජාතිප්‍රේමය හා ඒ සමාන වෙනත් දේ තුළ ඇති නොවැටහෙන දේ නම් ඒවායින් ඇතිවන යහපත හෝ අයහපත වෙන්කර ගන්නට නොහැකි වීමය.

**කිසියම් පුද්ගලයෙකු තම රට ජාතිය හෝ ආගම නොසළකා අමතක කොට ජීවත්විය යුතු යයි කිසිවෙකු යෝජනා නොකරනු ඇත. දේශප්‍රේමය ජාතිප්‍රේමය හා ඒ සමාන වෙනත් දේ තුළ ඇති නොවැටහෙන දේ නම් ඒවායින් ඇතිවන යහපත හෝ අයහපත වෙන්කර ගන්නට නොහැකි වීමය.**

දේශප්‍රේමය යනු රට වෙනුවෙන් පෙනී සිටීමයග ජාතිප්‍රේමය යනු ජාතිය වෙනුවෙන් පෙනී සිටීමය. එහි දොස් පැවරිය යුතු කිසිවක් නැත. ඒ දෙකම යහපත්ය. එහෙත් තම ජාතිය වෙනුවෙන් පෙනී සිටීම ඉක්මනන්ම අනෙක් ජාතියට එරෙහි වීමට පෙරලෙයි. තමන්ගේ රට ජාතිය වෙනුවෙන් පෙනී සිටීම අනෙකාගේ රට ජාතියට එරෙහි වීම ලෙස තේරුම් නොගත යුතුය. ඇත්තටම නම් තමන්ගේ රට ජාතියට හිතවත් වන ප්‍රමාණයට අප අනෙකාගේ රට ජාතිය ගැනද හිතවත් විය යුතුය. අනෙකාගේ රට ජාතියට ගෞරව නොකරනල ආදරය නොකරනල කෙනෙකු තමන්ගේ රට ජාතියට සැබෑ ලෙස ගෞරව කරන්නේද ආදරය කරන්නේද නැත.

බෞද්ධ ආචාර ධර්ම තුළින් මේ සම්බන්ධව වැඩිදුර ගුරුහරුකම් ගැනීමට අපට පුළුවන. ලෝක සත්වයාට මෛත්‍රිය කිරීම අරඹන්නේ පහසුවෙන් හා මුලින්ම කළ හැකි තමාට මෛත්‍රිය පැතිරවීමෙනි. තමාට මෛත්‍රිය කිරීම සඳහා අනුන්ට වෛර කිරීම අවශ්‍ය නොවේ. තමාට නිවැරදිව හා බුද්ධිමත්ව මෛත්‍රිය කරන කෙනෙකු සියළු ආකාරයේ නරක ක්‍රියාවලින් වැළකෙන අතර නිවැරදි මාවතේ ගමන් කරයිග එවිට අපට අප සමග හෝ සමාජය සමග ගැටුමක් ඇති නොවේ. අප අවට ලෝකය සමග සාමයෙන් හා සංහිඳියාවෙන් ජීවත්වීමට එයින් අපි වරම් ලබමු. ඊළඟ පියවර වන්නේ තමන්ට ඉතාම ළඟින් නුදුරින් සිටින අයට මෙත් සිත් පැතිරවීමයග තෙවැනි පියවර වන්නේ තමා සමග සබඳකම් පවත්වන අයට මෛත්‍රිය කිරීමයි.

සිව්වෙනි හා අවසාන පියවර වන්නේ තමන්ගේ සතුරන්ටද මෛත්‍රිය පැතිරවීමයග මෙය දුෂ්කර වුවද මෛත්‍රිය වැඩීම තුළ තමන්ගේ අධ්‍යාත්මික වර්ධනය හා අත්දැකීම් ලබන නිසා එය කළ හැකි දෙයක් වෙයිග මෙසේ මෛත්‍රිය හුරු කළ විට තමන් හා තමන්ගේ කිට්ටුවන්තයන් අතරද තමන් හා තමන් සබඳකම් පවත්වන්නන් අතරද තමන් හා හතුරන් අතරද වෙනස තුනීව යයි. නැතිව යයි. මෙය ඉන්ද්‍රජාලික සුරංගනා ලෝකයේ සිදුවන අභව්‍ය සිදුවීමක් නොවේග මෙය මිනිසුන් තුළ ගොඩ නගා ගත හැකි අපූර්ව තත්වයකි.

දේශප්‍රේමයට හා ජාතිප්‍රේමයට මෙසේ සියළු ජාතීන් හා දේශයන් එක්ව පෙමකින් වෙලන්නට හැකිවේද? සමහර විට මහත්මා ගාන්ධි එසේත් නැත්නම් ශ්‍රී ලාංකිකයෙකු වූ ආනන්ද කුමාරස්වාමි වැනි දේශප්‍රේමීහු හා ජාතිප්‍රේමීහු ජාතියට සංස්කෘතියට හා දේශයට ආදරය කරමින් සෙසු ජාතීන්ට සංසකෘතීන්ට දේශයන්ටද ප්‍රේම කළහ.

මේ සඳහා කෙනෙකුට පැහැදිලිව දැකිය හැකි මනසක් තිබිය යුතුයග මේ හැම විටකම කල්පනාකාරී වීමත් මිනිසුන් වර්ග කර ලේබල් ඇලවීමට ඉක්මන් නොවීමත් අවශ්‍යයග වර්ගීකරණය යනු බෙදා නිශ්චිත කණ්ඩායම්වලට වෙන් කිරීමය. එසේ කළ විට අනවරතව ගලා යන සමස්ථ ජීවිතය අපගේ සිත තුළ චිත්‍රණය නොවෙයි. වර්ගීකරණය යනු කෑලිවලට වෙන් කර තනි තනිවම ඒවා විමසීමය. ඒ තුළ සමස්ථය දැකිය නොහැකිවේ. වර්ගීකරණය තුල කැබලි වීම නිසා සිදුවන මේ අභාග්‍යය මිනිසා ගැන පමණක් නොව ස්වභාවධර්මය සම්බන්ධයෙන්ද රමණීයත්වය සම්බන්ධයෙන්ද වෙනත් බොහෝ දෑ සම්බන්ධයෙන්ද එකසේ අදාළය.

සියළුම ආගම් පිළිබඳ ප්‍රවේසමෙන් කරන ලද අධ්‍යයනයකින් පසු කිසියම් ආගමක් අනෙක් ඒවාට වඩා ශ්‍රේෂ්ඨ යයි තේරුම් ගෙන ඒ ආගම වැළඳගත් අය ලෝකය තුළ සිටී නම් ඒ අල්ප වශයෙනි. එහෙත් බහුතරයක් අපි උපතින් උරුම වූ ආගම තුළම රැඳී සිටිමු. මා කිසියම් ආගමක් උපතින් උරුම කර ගත් නිසාම ඒ ආගම පමණක්ම සත්‍ය බවත් අනෙක් ආගම් සියල්ල අල්පේච්ඡ බවත් කීම කොතෙක් දුරට සාධාරණ වන්නේද? මීටත් වඩා පටු වූද බාලවූද සිතිවිල්ලක් තවත් තිබිය හැකිද? මම බෞද්ධයෙක්ව උත්පත්තිය ලැබූ නිසාම බෞද්ධාගම සත්‍ය දෙසන එකම ආගම බවත් අනෙක් ආගම් තුළ ඇත්තේ බොරුව

38 පිටට